උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මැරිටයිම් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ මැරිටයිම් පත්තු ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ කෝවිල්කුඩිඉරුප්පු (මුල/95) ග්‍රාම නිලධාරි වසම තුළ කරික්කඩ්ඩුමූලෙයි උතුරේ මුලතිව් පාරිස් හි කෝවිල්කුඩිඉරුප්පු ගමේ සහ මුලතිව් හි පිහිටි විශාලත්වයෙන් අ.01, රූ.02ක් වන "මනල් තෝඩ්ඩම්" නමැති ඉඩම් කොටස සහ විශාලත්වයෙන් පර්චස් 21.62ක් වන "මනට් තෝඩ්ඩම්" නමැති තවත් ඉඩම් කොටසක් සහ විශාලත්වයෙන් රූ.01, පර්. 10.76ක් වන "මන්ට් තෝඩ්ඩම්" නමැති තවත් ඉඩම් කොටසක් සහ විශාලත්වයෙන් රූ.01, පර්. 33.50ක් වන "මනල් තෝඩ්ඩම්" නමැති තවත් ඉඩම් කොටසකින් සමන්විත යාබදව පිහිටි ඉඩම් කොටස් හතර ඒකාබද්ධ කොට සෑදුනු "මනල් තෝඩ්ඩම්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආරුමුගම් විසින් සාදන ලද අංක 2559එම් සහ 2016.05.29 දින දරන පිඹුරේ දැක්වෙන "ලොට් ඒ" දරන ඉඩම් කොටසට මායිම් වශයෙන්; නැගෙනහිරට : රජයේ ඉඩම ද; උතුරට : පාර ද; බස්නාහිරට : පටුමග සහ දකුණට: සින්නාරු ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් පහයි දශම හතක් (අ.02, රූ.01, පර්. 05.70) විශාලත්වයෙන් යුත් බිම් කොටස සහ ඒ තුළ පිහිටි හෝටල් ගොඩනැගිලි, ළිං, වගාවන්, ගහකොළ, පළතුරු ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10-269/2

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - රත්නපුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ඔවුන් වෙත ප්‍රදානය කරන ලද රු. 40,000,000.00 (රුපියල් මිලියන හතළිහක් පමණකි) ක කාලීන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. ඒ. හර්ෂිකා විසින් ලියා සහතික කරන ලද 2024.06.06 දිනැති අංක 374 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් රු. 34,998,000.00 ක ප්‍රාග්ධන හිඟය මත 2025.06.03 වැනි දින සිට AWPLR+2% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.06.02 වැනි දිනට රු. 36,845,673.38 (රුපියල් මිලියන තිස් හයයි අට ලක්ෂ හතළිස් පන් දහස් හයසිය හැත්තෑ තුනයි ශත තිස් අටක් පමණකි) ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ඔවුන් වෙත ප්‍රදානය කරන ලද රු. 825,000,000.00 (රුපියල් මිලියන අටසිය විසි පහක් පමණකි)ක විශේෂිත මූල්‍ය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. ඒ. හර්ෂිකා විසින් ලියා සහතික කරන ලද 2024.06.06 දිනැති අංක 374 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් 2025.06.03 වැනි දින සිට AWPLR+2% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.06.02 වැනි දිනට රු. 247,836,420.88 (රුපියල් මිලියන දෙසිය හතළිස් හතයි අට ලක්ෂ තිස් හය දහස් හාරසිය විස්සයි ශත අසූ අටක් පමණකි) ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

තව ද, එකී ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එකී බැඳුම්කර මත සහ අනිකුත් පහසුකම් අතර ඔවුන් වෙත ප්‍රදානය කරන ලද එකී රු. 40,000,000.00 ක කාලීන ණය පහසුකම සහ රු. 825,000,000.00 ක විශේෂිත මූල්‍ය පහසුකම එකතුව රු. 865,000,000.00 (රුපියල් මිලියන අටසිය හැට පහක් පමණකි) මුදලක් මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2025 ජූනි මස 02 දිනට රු. 36,845,673.38ක් සහ රු. 247,836,420.88ක මුදලක් එකතුව රු. 284,682,094.26 (රුපියල් මිලියන දෙසිය අසූ හතරයි හය ලක්ෂ අසූ දෙදහස් අනූ හතරයි ශත විසි හයක් පමණකි)ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 34,998,000.00 ක ප්‍රාග්ධන හිඟය මත 2025 ජූනි මස 03 වැනි දින සිට AWPLR+2% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 36,845,673.38ක් සහ 2025 ජූනි මස 03 වැනි දින සිට AWPLR+2% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 247,836,420.88ක මුදලක් සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 374 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මූළු දිවයිනට ම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩ පත්තුව දකුණේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ රත්නපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ මලන්ගම ග්‍රාම නිලධාරි වසම තුළ මලන්ගම ගමේ පිහිටි "බතලහේනේ කොටස *හෙවත්* විලකොලදෙනිය වත්තේ කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එඩ්වඩ්. වී. විජේසූරිය විසින් සාදන ලද අංක 1851 හා 2009.08.11 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද; දකුණට : පාර සහ ප්‍රවේශ මාර්ගය (බලයලත් මිනින්දෝරු සමරසේකර විසින් සාදන ලද අංක 7717 සහ 2005.03.07 දින දරන පිඹුරේ ලොට් 13හි කොටස) සහ බස්නාහිරට : ප්‍රවේශ මාර්ගය (බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද අංක 7717 සහ 2005.03.07 දින දරන පිඹුරේ ලොට් 13හි කොටස) සහ බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්ස (රූ.2, පර්. 20ක්) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම කේ - 45/141 යටතේ ලියාපදිංචි වී තිබේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව ඉහත කී දේපළ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩ පත්තුව දකුණේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රත්නපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ මලන්ගම ග්‍රාම නිලධාරි වසම තුළ මලන්ගම ගමේ පිහිටි "බතලහේන *හෙවත්* විලකොලදෙනිය වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එස්. රණතුංග විසින් සාදන ලද අංක 2998 හා 2020.12.31 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්: උතුරට : බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1 සහ 13 වන පටුමග ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1 (13 වන පටුමග) සහ සමණල උයන ප්‍රධාන පාර ද; දකුණට : සමණල උයන ප්‍රධාන පාර සහ බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද අංක 7717 සහ 2005.03.07 දින දරන පිඹුරේ ලොට් 13 (12 වන පටුමග) සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද අංක 7717 සහ 2005.03.07 දින දරන පිඹුරේ ලොට් 13 (12 වන පටුමග) සහ බලයලත් මිනින්දෝරු ඊ. ඒ. බූපාධීර විසින් සාදන ලද අංක 2006 සහ 2005.12.20 දින දරන පිඹුරේ ලොට් 1 ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (රූ. 2, පර්. 20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

ඉහත කී අංක 374 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති, බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද අංක 7717 සහ 2005.03.07 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 81 සහ ලොට් 13 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස් මතින් වන මාර්ග අයිතිය (ප්‍රවේශ මාර්ගය සහ කාණු) ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10-269/3

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ඇල්පිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි

2025 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද රු. 30,000,000.00 (රුපියල් මිලියන තිහක් පමණකි) ක සංවර්ධන ණය I පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට දෙකම ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2017.02.23 දිනැති අංක 189 දරන හා 2018.06.26 දිනැති අංක 333 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව රු. 19,997,500.01 ක ප්‍රාග්ධන හිඟ මුදල මත 2025.05.16 වන දින සිට වර්ෂයකට AWPLR+3.25% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.05.15 වැනි දිනට රු. 21,565,319.40 (රුපියල් මිලියන විසි එකයි පන් ලක්ෂ හැට පන් දහස් තුන්සිය දහනවයයි ශත හතළිහක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද රු. 8,336,153.79 (රුපියල් මිලියන අටයි තුන් ලක්ෂ තිස් හය දහස් එකසිය පනස් තුනයි ශත හැත්තෑ නවයක් පමණකි) සංවර්ධන ණය II පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට දෙකම ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2017.02.23 දිනැති අංක 189 දරන හා 2018.06.26 දිනැති අංක 333 දරන, 2018.12.24 දිනැති අංක 398 දරන සහ 2019.04.30 දිනැති අංක 435 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද 2021.05.20 දිනැති අංක 4265 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීෂා විසින් ලියා සහතික කරන ලද 2023.09.19 දිනැති අංක 162 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව රු. 7,836,153.79 ක ප්‍රාග්ධන හිඟ මුදල මත 2025.05.16 වන දින සිට වර්ෂයකට 14% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.05.15 වැනි දිනට රු. 8,600,144.34 (රුපියල් මිලියන අටයි හය ලක්ෂ එකසිය හතළිස් හතරයි ශත තිස් හතරක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද රු. 16,146,586.49 (රුපියල් මිලියන දහසයයි එක් ලක්ෂ හතළිස් හය දහස් පන්සිය අසූ හයයි ශත හතළිස් නවයක් පමණකි) ක සංවර්ධන ණය III පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට සියල්ලම ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2017.02.23 දිනැති අංක 189 දරන හා 2018.06.26 දිනැති අංක 333 දරන, 2018.12.24 දිනැති අංක 398 දරන සහ 2019.04.30 දිනැති අංක 435 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද 2021.05.20 දිනැති අංක 4265 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීෂා විසින් ලියා සහතික කරන ලද 2023.09.19 දිනැති අංක 162 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව රු. 15,526,586.49ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025.05.16 වැනි දින සිට වර්ෂයකට AWPLR+3.25% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.05.15 වැනි දිනට රු. 16,817,368.37 (රුපියල් මිලියන දහසයයි අට ලක්ෂ දහහත් දහස් තුන්සිය හැට අටයි ශත තිස් හතක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද රු. 9,812,400.00 (රුපියල් මිලියන නවයයි අට ලක්ෂ දොළොස් දහස් හාරසියයක් පමණකි) කාලීන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට සියල්ලම ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2017.02.23 දිනැති අංක 189 දරන හා 2018.06.26 දිනැති අංක 333 දරන, 2018.12.24 දිනැති අංක 398 දරන සහ 2019.04.30 දිනැති අංක 435 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද 2021.05.20 දිනැති අංක 4265 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීෂා විසින් ලියා සහතික කරන ලද 2023.09.19 දිනැති අංක 162 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ

අනුව රු. 8,176,800.00 ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025.05.16 වැනි දින සිට වර්ෂයකට 18% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.05.15 වැනි දිනට රු. 9,151,771.23 (රුපියල් මිලියන නවයයි එක් ලක්ෂ පනස් එක් දහස් හත්සිය හැත්තෑ එකයි ශත විසි තුනක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද රු. 5,000,000.00 (රුපියල් මිලියන පහක් පමණකි)ක ස්ථාවර අයිරා I පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට සියල්ලම ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2017.02.23 දිනැති අංක 189 දරන හා 2018.06.26 දිනැති අංක 333 දරන, 2018.12.24 දිනැති අංක 398 දරන සහ 2019.04.30 දිනැති අංක 435 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද 2021.05.20 දිනැති අංක 4265 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීෂා විසින් ලියා සහතික කරන ලද 2023.09.19 දිනැති අංක 162 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් 2025.05.16 වැනි දින සිට වර්ෂයකට AWPLR+3.5% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.05.15 වැනි දිනට රු. 5,210,976.61 (රුපියල් මිලියන පහයි දෙලක්ෂ දහ දහස් නවසිය හැත්තෑ හයයි ශත හැට එකක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

තව ද එකී ඉන්දික තුෂාර නල්ලපෙරුම තන්ත්‍රි විසින් එකී බැඳුම්කර මත සහ අනිකුත් පහසුකම් අතර එකී ණයකරු වෙත ප්‍රදානය කරන ලද එකී රු. 30,000,000.00 ක සංවර්ධන ණය I පහසුකම, රු. 8,336,153.79ක සංවර්ධන ණය II පහසුකම, රු. 16,146,586.49ක සංවර්ධණ ණය III පහසුකම, රු. 9,812,400.00ක කාලීන ණය පහසුකම සහ රු. 5,000,000.00ක ස්ථාවර අයිරා පහසුකම එකතුව රු. 69,295,140.28 (රුපියල් මිලියන හැට නවයයි දෙලක්ෂ අනූ පන් දහස් එකසිය හතළිහයි ශත විසි අට පමණකි) ක මුදලක් මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2025 මැයි මස 15 වැනි දිනට රු. 21,565,319.40 ක්, රු. 8,600,144.34 ක්, රු. 16,817,368.37ක්, රු. 9,151,771.23ක් සහ රු. 5,210,976.61ක මුදලක් එකතුව රු. 61,345,579.95 (රුපියල් මිලියන හැට එකයි තුන් ලක්ෂ හතළිස් පන් දහස් පන්සිය හැත්තෑ නවයයි ශත අනූ පහක් පමණකි) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 19,997,500.01ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025 මැයි මස 16 වැනි දින සිට වර්ෂයකට AWPLR + 3.25%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 21,565,319.40ක්, රු. 7,836,153.79ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025 මැයි මස 16 වැනි දින සිට වර්ෂයකට 14%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 8,600,144.34ක්, රු. 15,526,586.49ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025 මැයි මස 16 වැනි දින සිට වර්ෂයකට AWPLR+3.25%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 16,817,368.37ක්, රු. 8,176,800.00ක හිඟ ප්‍රාග්ධන මුදල මත 2025 මැයි මස 16 වැනි දින සිට වර්ෂයකට 18%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 9,151,771.23ක් සහ 2025 මැයි මස 16 වැනි දින සිට වර්ෂයකට AWPLR+3.25%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 5,210,976.61ක මුදලක් සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 189, 333, 398, 435, 4265 සහ 162 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 127ඩී - උළුවිටිකේ ග්‍රාම නිලධාරි වසම තුළ උළුවිටිකේ ගමේ පිහිටි "පතිනවත්ත සහ කටුකුරුන්දගේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පී. රණවක විසින් සාදන ලද අංක 2016/20 හා 2016.09.11 දින දරන මානක පිඹුරේ දැක්වෙන ලොට් ඒ වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : පතිනායවත්ත ද; නැගෙනහිරට : ලොට් 5 (අඩි 12ක් පළල පාර) ද; දකුණට : අංක 2016/17 දරන පිඹුරේ ලොට් ඒ සහ අංක 59 දරන පිඹුරේ ලොට් 1සී සහ 1ඩී සහ බස්නාහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිහයි දශම දෙකයි හතරක් (රූ.1, පර්. 30.24) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ඇතුලු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10-269/4

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

බයෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ක් වූ සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් බයෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද එ.ජ.ඩො. 3,000,000.00 (එක්සත් ජනපද ඩොලර් මිලියන තුනක් පමණකි) ක කාලීන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2015.12.07 දිනැති අංක 4165 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව බයෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළේ බදු අයිතිවාසිකම් උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එ.ජ.ඩො. 493,311.00ක ප්‍රාග්ධන හිඟය මත 2025.02.11 වැනි දින සිට මාස 03ක USD LIBOR+4.5% ක (මාසික සමාලෝචනය) අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2025.02.10 වැනි දිනට එ.ජ.ඩො. 590,721.12 (එක්සත් ජනපද ඩොලර් පන් ලක්ෂ අනූ දහස් හත්සිය විසි එකයි ශත දොළහක) හෝ එහි ශ්‍රී ලංකා රුපියල් වටිනාකම හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

තව ද, එකී බයෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එකී බැඳුම්කරය මත සහ අනිකුත් පහසුකම් අතර ඔවුන් වෙත ප්‍රදානය කරන ලද එකී එ.ජ.ඩො. 3,000,000.00 (එක්සත් ජනපද ඩොලර් මිලියන තුනක් පමණකි)ක කාලීන ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2025 පෙබරවාරි මස 10 වැනි දිනට එ.ජ.ඩො. 590,721.12 (එක්සත් ජනපද ඩොලර් පන් ලක්ෂ අනූ දහස් හත්සිය විසි එකයි ශත දොළහ) හෝ එහි ශ්‍රී ලංකා රුපියල් වටිනාකම හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා එ.ජ.ඩො. 493,311.00 ක ප්‍රාග්ධන හිඟය මත 2025 පෙබරවාරි මස 11 වැනි දින සිට මාස 3ක USD LIBOR + 4.5%ක (මාසික සමාලෝචනය) අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එ.ජ.ඩො. 590,721.12 හෝ ඊට සමාන වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 4165 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළවල බදු අයිතිවාසිකම්, මුළු දිවයිනට ම බලයලත් වෙන්දේසිකරු තිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, පිටිගල් කෝරළේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ පන්නල ප්‍රාදේශීය සභා සීමාව තුළ 1586 - නලවලාන ග්‍රාමනිලධාරි වසම තුළ නලවල ගමේ (එෆ්.වී.පී. 287) සහ නවලාන ගමේ පිහිටි "මාකඳුර වට නැගෙනහිර දැන් මාකඳුර කාර්මික කලාපය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. ප්‍රේමසිරි විසින් සාදන ලද අංක 0955 හා 2009.07.10 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : පාර (ප්‍රාදේශීය සභා) ද; නැගෙනහිරට : මාකඳුර වත්ත (කොටසක්) ද; දකුණට : මාකඳුර (කොටසක්) එල්ආර්සී සහ ලොට් 08 සහ බස්නාහිරට : ලොට් 03 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් දොළහයි දශම පහ (අ.2, රූ.1, පර්.12.5ක්) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම නවයයි හතරයි දෙකයි දෙක (හෙක්. 0.9422) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සෑම සියළු දේද සමග වේ. තව ද එකී පිඹුරේ ලකුණු කර ඇති මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10-269/5

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2024 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන

පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 20,000,000.00 (රුපියල් මිලියන විස්සක් පමණකි) ක ප්‍රතිමූල්‍ය කාලීන ණය I පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් දෙකම ලියා සහතික කරන ලද 2017.12.20 දිනැති අංක 5831 දරන සහ 2018.04.11 දිනැති අංක 5941 දරන උකස් බැඳුම්කර මගින් ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ ජයවර්ධන මුදියන්සේලාගේ හේමින්ද වාරක බණ්ඩාර ජයවර්ධන උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් රු. 17,379,811.78ක ප්‍රාග්ධන හිඟයක් මත 2023.06.13 වැනි දින සිට 6%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2023.06.12 වැනි දිනට රු. 18,080,279.81 (රුපියල් මිලියන දහඅටයි අසූ දහස් දෙසිය හැත්තෑ නවයයි ශත අසූ එකක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 20,000,000.00 (රුපියල් මිලියන විස්සක් පමණකි) ක ප්‍රතිමූල්‍ය කාලීන ණය II පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් දෙකම ලියා සහතික කරන ලද 2017.12.20 දිනැති අංක 5831 දරන සහ 2018.04.11 දිනැති අංක 5941 දරන උකස් බැඳුම්කර මගින් ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ ජයවර්ධන මුදියන්සේලාගේ හේමින්ද වාරක බණ්ඩාර ජයවර්ධන උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් රු. 17,061,313.26 ක ප්‍රාග්ධන හිඟයක් මත 2023.06.13 වැනි දින සිට 6.54%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2023.06.12 වැනි දිනට රු. 17,323,499.80 (රුපියල් මිලියන දහහතයි තුන් ලක්ෂ විසි තුන් දහස් හාරසිය අනූ නවයයි ශත අසූවක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 15,000,000.00 (රුපියල් මිලියන පහළොවක් පමණකි) ක සංවර්ධන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් දෙකම ලියා සහතික කරන ලද 2017.12.20 දිනැති අංක 5831 දරන සහ 2018.04.11 දිනැති අංක 5941 දරන උකස් බැඳුම්කර මගින් ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ ජයවර්ධන මුදියන්සේලාගේ හේමින්ද වාරක බණ්ඩාර ජයවර්ධන උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, තව ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් රු. 12,720,066.19ක ප්‍රාග්ධන හිඟය මත 2023.06.13 වැනි දින සිට 6.54%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග 2023.06.12 වැනි දිනට රු. 13,076,052.29 (රුපියල් මිලියන දහතුනයි හැත්තෑ හය දහස් පනස් දෙකයි ශත විසි නවයක) මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබේ.

තව ද එකී ජේ වූ ඩබ්ලිව් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එකී බැඳුම්කර මත සහ අනිකුත් පහසුකම් අතර ඔවුන් වෙත ප්‍රදානය කරන ලද එකී රු. 20,000,000.00 ක ප්‍රතිමූල්‍ය කාලීන ණය I පහසුකම රු. 20,000,000.00 ක ප්‍රතිමූල්‍ය කාලීන ණය II පහසුකම සහ රු. 15,000,000.00 ක සංවර්ධන ණය පහසුකම එකතුව රු. 55,000,000.00 (රුපියල් මිලියන පනස් පහක් පමණකි)ක් මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2023 ජූනි මස 12 වැනි දිනට රු. 18,080,279.81, රු. 17,323,499.80 සහ රු. 13,076,052.29ක මුදලක් එකතුව රු. 48,479,831.89 (රුපියල් මිලියන හතළිස් අටයි හාර ලක්ෂ හැත්තෑ නව දහස් අටසිය තිස් එකයි ශත අසූ නවයක)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 17,379,811.78, රු. 17,061,313.26 සහ රු. 12,720,066.19 ක ප්‍රාග්ධන හිඟය මත 2023 ජූනි මස 13 වැනි දින සිට පිළිවෙලින් 6%, 6.54% සහ 6.54% අනුපාතයට අනුව තවදුරටත් පොළිය ද සමග රු. 18,080,279.81 ක, රු. 17,323,499.80ක සහ රු. 13,076,052.29ක මුදලක් එකතුව රු. 48,479,831.89ක එකී මුදල් සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 5831 සහ 5941 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 1206 - දෙමටලුව ග්‍රාමනිලධාරි වසම තුළ දෙමටලුව ගමේ

පිහිටි "හුරිගොල්ල වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. පී. බණ්ඩාර විසින් සාදන ලද අංක 3059 සහ 2008 ජනවාරි මස 30 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ 2 වශයෙන් ලකුණුකර ඇති එකට යාව පිහිටි බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස්වලට මායිම් වශයෙන්, උතුරට : තෙන්නකෝන් සහ තවත් අයගේ ඉඩම වෙන්කරන පැලඉනි සහ කම්බි වැට; නැගෙනහිරට : තෙන්නකෝන් සහ තවත් අයගේ ඉඩම වෙන්කරන පැලඉනි සහ කම්බි වැට ද; දකුණට : ටී. එම්. ටිකිරි බණ්ඩා සහ තවත් අයගේ ඉඩම සහ බස්නාහිරට : ටිකිරි බණ්ඩාගේ ඉඩම සහ වේදණ්ඩ සිට පල්ලම්දෙනිය දක්වා දිවෙන ප්‍රධාන පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දහතුනයි රූඩ් දෙකයි පර්චස් දහහතක් (අ.13, රූ.2, පර්. 17) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේද සමග වේ.

එකී දේපළ, පහත දැක්වෙන ඉඩම් කොටස් නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 1206 - දෙමටලුව ග්‍රාමනිලධාරි වසම තුළ දෙමටලුව ගමේ පිහිටි "හුරිගොල්ල වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ටී. එෆ්. ඩයස් විසින් සාදන ලද අංක 1658 සහ 1973 මාර්තු මස 19 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 සහ 4 වශයෙන් ලකුණුකර ඇති එකට යාව පිහිටි බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස්වලට මායිම් වශයෙන් : උතුරට : කිරිබණ්ඩා සහ තවත් අයගේ ඉඩම ද; නැගෙනහිරට : තෙන්නකෝන් සහ තවත් අයගේ ඉඩම ද; දකුණට : ටී. එම්. ටිකිරි බණ්ඩා සහ තවත් අයගේ ඉඩම සහ බස්නාහිරට : ටිකිරි බණ්ඩාගේ ඉඩම සහ ලොට් 1 වෙන්කරන පී. ඩබ්. ඩී. පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දහහතරයි රූඩ් එකයි පර්චස් පහළොවක් (අ.14, රූ.1, පර්. 15) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
මාණ්ඩලික ලේකම්.

10-325

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. එම්. එස්. ධර්මසේන.
ගිණුම් අංක : 0156 5000 0452.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද 2012 මාර්තු මස 09 දාතම හා අංක 5922 සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුභසිංහ විසින් ලියා සහතික කරන ලද 2015 සැප්තැම්බර් මස 04 දාතම හා අංක 2776 දරන, 2017 අප්‍රේල් මස 19 දාතම හා අංක 4157 දරන, 2019 පෙබරවාරි මස 08 දාතම හා අංක 5666 දරන හා 2019 ජූනි මස 14 දාතම හා අංක 5947 යන උකස් බැඳුම්කර සියල්ල සහ අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. කේ. ආලෝකබණ්ඩාර විසින් ලියා සහතික කරන ලද 2022 පෙබරවාරි මස 28 දාතම හා අංක 1999 දරන හා 2023 අගෝස්තු මස 23 දාතම හා අංක 2177 දරන, උකස් බැඳුම්කර දෙක යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහොට්ටි මුදියන්සේලාගේ සුගත් ධර්මසේන බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 5992, 2776, 4157, 5666, 5947, 1999 සහ 2177 උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට දෙලක්ෂ දොළොස් දහස් හත්සිය හැට නවයයි ශත හැත්තෑ පහක (රු.6,212,769.75) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට දෙලක්ෂ දොළොස් දහස් හත්සිය හැට නවයයි ශත හැත්තෑ පහක (රු. 6,212,769.75) මුදල ද, 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 5992, 2776, 4157, 5666, 5947, 1999 සහ 2177 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් නව ලක්ෂ අනූ හය දහසක (රු. 5,996,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 5992, 2776, 4157, 5666, 5947, 1999 සහ 2177 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පුත්තලම් පත්තුවේ,

පුත්තලම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නෙළුම්වැව, අංක 615 C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නෙළුම්වැව ග්‍රාමයේ පිහිටි "නෙළුම්වැව මුකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඕ. එම්. නජීබ් විසින් සාදන ලද 2022 මාර්තු මස 27 දාතම හා අංක 13543 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රා. ස.); නැගෙනහිරට : පී. එස්. මල්කාන්ති පීරිස්ගේ ඉඩම; දකුණට : පී. එස්. මල්කාන්ති පීරිස්ගේ ඉඩම සහ බස්නාහිරට : පාර (මා. සං. අ.) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම දෙකක් (රූ. 1, පර්. 9.2) හෝ හෙක්ටයාර 0.1244 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී පිඹුරු අංක 13543 ට අනුව ය.

එකී ලොට් 1 පහත ඉඩමේ නැවත මිනුමකි :

එකී නෙළුම්වැව ග්‍රාමයේ පිහිටි "නෙළුම්වැව මුකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. බාලසුබ්‍රමනියම් විසින් සාදන ලද 2008 නොවැම්බර් මස 18 දාතම හා අංක 133/2008 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රා. ස.); නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : පාර ( මා. සං. අ.) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම දෙකක් (රූ.1, පර්. 9.2) හෝ හෙක්ටයාර 0.1244 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග පිඹුරු අංක 133/2008 ට අනුව වෙළුම්/ පත්‍ඉරුව LDO A/Puth/18/168 ට අනුව පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 331

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඇඹිලිපිටිය ග්ලාස් සෙන්ටර්.
ගිණුම් අංක : 0043 1000 0200.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි විසින් ලියා සහතික කරන ලද 2018 මාර්තු මස 19 දාතම හා අංක 2918 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "ඇඹිලිපිටිය ග්ලාස් සෙන්ටර්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන අල්ගම කෝරාලලාගේ ලක්මාල් ප්‍රසාද් කුමාර පෙරේරා බන්ධනදායි වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 2918 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය කෝටි විසි තුන් ලක්ෂ අසූ හතර දහස් තුන්සිය අසූ එකයි ශත විස්සක (රු. 62,384,381.20) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 2918 දරන උකස් බැඳුම්කරය, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය කෝටි විසි තුන් ලක්ෂ අසූ හතර දහස් තුන්සිය අසූ එකයි ශත විස්සක (රු. 62,384,381.20) මුදල ද, 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 2918 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැට හතර ලක්ෂ පනස් දහසක (රු. 16,450,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) හා තවත් රුපියල් තුන් කෝටි අසූ නව ලක්ෂ හැත්තෑ හය දහසක (රු. 38,976,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 2918 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, උඩගම

ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ උඩගම ග්‍රාමයේ (FVP 778) පිහිටි "මහකුඹුකේ හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කංනන්ගර විසින් සාදන ලද 2006 දෙසැම්බර් මස 20 දාතම හා අංක 06/280 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : සී. එම්. අබේවර්ධන විසින් හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට : එල්. කේ. ජේම්ස් විසින් හිමිකම් කියන ඉඩම; දකුණට : ප්‍රධාන පාර (කොලොන්න සිට ඇඹිලිපිටිය දක්වා) සහ බස්නාහිරට : කේ. එල්. විජේවර්ධන සහ ඩී. එම්. අබේරත්න විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහයයි දශම නවයයි එකක් (අ.1, රූ.3, පර්. 10.91) විශාල ඉඩම් කොටස එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 06/280 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව L 154/102 යටතේ ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 333

---

**සම්පත් බැංකුව පීඑල්සී**

**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

වයි. ටී. ඩී. ද සිල්වා

ගිණුම් අංක : 1074 5767 5974.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.08.13 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි මස 24 දාතම හා අංක 2823 දරන, 2020 අගෝස්තු මස 04 දාතම හා අංක 3093 දරන උකස් බැඳුම්කර දෙක, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. නල්ලපෙරුම විසින් ලියා සහතික කරන ලද 2022 ජූනි මස 28 දාතම හා අංක 1266 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. කරුණාතිලක විසින් ලියා සහතික කරන ලද 2023 ජූනි මස 15 දාතම හා අංක 3678 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යාගම තිලනි ධර්මජිත් ද සිල්වා බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2823, 3093, 1266 සහ 3678 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර කෝටි පනස් හය ලක්ෂ විසි නව දහස් හැත්තෑ අටයි ශත දහ අටක (රු. 45,629,078.18) මුදලක් 2025 ජූනි මස 08 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර කෝටි පනස් හය ලක්ෂ විසි නව දහස් හැත්තෑ අටයි ශත දහ අටක (රු. 45,629,078.18) මුදල ද, 2025 ජූනි මස 09 වැනි දින සිට අංක 2823, 3093, 1266 සහ 3678 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හතළිස් දෙලක්ෂ විසි දහසක (රු. 34,220,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම බිංදුවක් (13.0%) හා තවත් රුපියල් පනස් අට ලක්ෂ හැට අට දහසක (රු. 5,868,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයයට දහසයයි දශම පහයි බිංදුවක් (16.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 2823, 3093, 1266 සහ 3678 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලවිට කෝරළේ, බලපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අහුංගල්ල අංක 18 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අහුංගල්ල ග්‍රාමයේ පිහිටි "වෙලවත්ත *නොහොත්* වෙලබඩවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එච්. ඩී. සිල්වා විසින් සාදන ලද 2019 මැයි මස 31 දාතම හා අංක 1577 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අඹගහවත්ත, බිංදුගේවත්ත සහ ජුවන් මහදුර ගෙදරවත්ත; නැගෙනහිරට : ගාල්ල සිට කොළඹ දක්වා ප්‍රධාන පාර (මා. සං. අ.); දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : කොට්ටන්ගේපිටියේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකයි දශම පහක් (රූ.2, පර්. 1.5) හෝ හෙක්ටයාර 0.2060 ක් විශාල ඉඩම් කොටස කොළඹ පාර, වරිපනම් අංක 31 දරන ගොඩනැගිල්ල

සහ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1577 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 177/133 (වෙනත් විස්තර තීරුව) යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහතින් දැක්වෙන ඉඩම පහත විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලවිට කෝරළේ, බලපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අහුංගල්ල අංක 18 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අහුංගල්ල ග්‍රාමයේ පිහිටි "වෙලවත්ත *නොහොත්* වෙලබඩවත්ත" යයි කියනු ලබන සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අඹගහවත්ත සහ බිංදුවගේවත්ත; නැගෙනහිරට: ගාල්ල සිට කොළඹ දක්වා ප්‍රධාන පාර; දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : කොට්ටන්ගේපිටියේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකයි දශම පහක් (රූ. 2, පර්. 1.5) විශාල ඉඩම් කොටස කොළඹ පාර, වරිපනම් අංක 31 දරන ගොඩනැගිල්ල සහ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව D 177/133 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10 - 332

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එලිසියන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් (BR - 1)
ගිණුම් අංක : 0101 1000 0907.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2016 මැයි මස 05 දාතම හා අංක 1593 දරන උකස්බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක PV 105491 දරන සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන එලිසියන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1593 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනව කෝටි පනස් පන් ලක්ෂ තිස් එක් දහස් එකසිය දෙකයි ශත දහ තුනක (රු. 195,531,102.13) මුදලක් 2025 සැප්තැම්බර් මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහ නව කෝටි පනස් පන් ලක්ෂ තිස් එක් දහස් එකසිය දෙකයි ශත දහ තුනක (රු. 195,531,102.13) මුදල ද, 2025 සැප්තැම්බර් මස 12 දින සිට අංක 1593 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි පනස් අට ලක්ෂ හැත්තෑ නව දහස් දහ හතරයි ශත අසූ දෙකක (රු. 65,879,014.82) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) හා තවත් රුපියල් හය කෝටි හතළිස් අට ලක්ෂයක (රු. 64,800,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three per centum (AWPLR + 3%) per annum [Floor rate of Nine per centum (9%) per annum] බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 1593 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ සහ රත්මලාන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ගල්කිස්ස අංක 541 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගල්කිස්ස පිහිටි ද සේරම් පාර, වරිපනම් අංක 34/8 දරන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. ටී. සිල්වා යන අය විසින් සාදන ලද 1983 මැයි මස 28 දාතම හා අංක 255 දරන පිඹුරේ නිරූපිත ලොට් 4A සහ 4B ඒකාබද්ධයක් සහ නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2015 ජූනි මස 05 දාතම හා අංක 10973 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට

ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : පාර (අඩි 20 පළල); නැගෙනහිරට : ද සේරම් පාර, වරිපනම් අංක 34/9 දරන පරිශ්‍රයන්; දකුණට : පාර - අඩි 20 පළල (බලයලත් මානක තැන ඩී. එල්. පීරිස් යන අය විසින් සාදන ලද 1960 පෙබරවාරි මස 20 දාතම හා අංක 686 දරන පිඹුරේ නිරූපිත ලොට් 13) සහ බස්නාහිරට : ද සේරම් පාර වරිපනම් අංක 34/7 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම තුනයි බිංදුවක් (පර්. 24.30) හෝ හෙක්ටයාර 0.0615 විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 10973 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව E 115/88 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10 - 360/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එලිසියන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් (BR - 2)
ගිණුම් අංකය : 0101 1000 0907.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2016 මැයි මස 05 දාතම හා අංක 1593 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක PV 105491 දරන සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන එලිසියන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1593 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහ නව කෝටි පනස් පන් ලක්ෂ තිස්එක් දහස් එකසියදෙකයි ශත දහතුනක (රු. 195,531,102.13) මුදලක් 2025 සැප්තැම්බර් මස 11වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහ නව කෝටි පනස් පන් ලක්ෂ තිස් එක් දහස් එකසිය දෙකයි ශත දහ තුනක (රු. 195,531,102.13) මුදල ද, 2025 සැප්තැම්බර් මස 12 දින සිට අංක 1593 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි පනස් අට ලක්ෂ හැත්තෑ නව දහස් දහ හතරයි ශත අසූ දෙකක (රු. 65,879,014.82) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) හා තවත් රුපියල් හය කෝටි හතළිස් අට ලක්ෂයක (රු. 64,800,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three per centum (AWPLR + 3%) per annum [Floor rate of Nine per centum (9%) per annum] බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 1593 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ සහ රත්මලාන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ගල්කිස්ස අංක 541 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ ගල්කිස්ස පිහිටි ද සේරම් පාර, වරිපනම් අංක 34/8 දරන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. ටී. සිල්වා යන අය විසින් සාදන ලද 1983 මැයි මස 28 දාතම හා අංක 225 දරන පිඹුරේ නිරූපිත ලොට් 4A සහ 4B ඒකාබද්ධයක් සහ නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ගාමිණී බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2015 ජූනි මස 05 දාතම හා අංක 10973 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (අඩි 20 පළල); නැගෙනහිරට : ද සේරම් පාර, වරිපනම් අංක 34/9 දරන පරිශ්‍රයන්; දකුණට : පාර - අඩි 20 පළල (බලයලත් මානක තැන ඩී. එල්. පීරිස් යන අය විසින් සාදන ලද 1960 පෙබරවාරි මස 20 දාතම හා අංක 686 දරන පිඹුරේ නිරූපිත ලොට් 13) සහ බස්නාහිරට : ද සේරම් පාර වරිපනම් අංක 34/7 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම තුනයි බිංදුවක් (පර්. 24.30) හෝ හෙක්ටයාර 0.0615 විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 10973 දරන පිඹුරට අනුව

වෙළුම/පත්‍රිරුව E 115/88 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10 - 360/2

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මහනුවර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම.
ණය ගිණුම් අංකය : 2944030 සහ 3124924.

2025 ක් වූ අගෝස්තු මස 29 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් ලියා සහතික කරන ලද 2008.07.10 දිනැති අංක 4669, 2009.06.24 දිනැති අංක 4905 උකස් බැඳුම්කර සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4292 දරන උකස් බැඳුම්කරය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1583 සහ අංක 1584 දරන අතිරේක උකස් දරන සමග කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි ලෙස සංස්ථාගත කරන ලද සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 52/1/ඩී, නව නුවර පාර, කොතලාවල, කඩුවෙල සහ අංක 4, කුමුදු මාවත, ප්‍රිම්රෝස් ගාර්ඩන්ස්, මහනුවර යන ස්ථානයේ පිහිටා ඇති සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් ලියා සහතික කරන ලද 2005.07.20 දිනැති අංක 3688 සහ 2011.03.24 දිනැති අංක 5469 දරන උකස් බැඳුම්කරයන් සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1587 සහ අංක 1588 දරන අතිරේක උකස් දරන සමග කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරයන් මත සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එච්. බී. ඩී. විජේකෝන් විසින් ලියා සහතික කරන ලද 2005.10.11 දිනැති අංක 4017 දිනැති උකස් බැඳුම්කරයන් සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1585 සහ අංක 1586 දරන අතිරේක උකස් දරන සමග කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරයන් මත සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් මෙහි තුන්වන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති ඉඩම සහ දේපළ සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් ලියා සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4294 සහ 2015.03.13 දිනැති අංක 4760 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරයන් මත සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් මෙහි හතරවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති යන්ත්‍රෝපකරණ සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් ලියා සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4293 සහ 2015.03.13 දිනැති අංක 4761 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරයන් මත සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් මෙහි පස්වන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති යන්ත්‍රෝපකරණ සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී බැඳුම්කරය යටතේ ඇමරිකානු ඩොලර් එක් මිලියන හත්ලක්ෂ තුන්දහස් අටසිය හැට අටයි ශත දොළහක (ඇමෙරිකානු ඩොලර් 1,703,868.12) මුදලක් (හෝ පියවීම සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන මුදල) 2025 ජූලි මස 22 වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී

ඇමරිකානු ඩොලර් එක් මිලියන හත්ලක්ෂ තුන්දහස් අටසිය හැට අටයි ශත දොළහ (ඇමෙරිකානු ඩොලර් 1,703,868.12) මුදල (හෝ පියවීම සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන මුදල) මුදල ප්‍රතිනිර්මාණය කරන ලද ණය ගිණුම් අංක 2944030 සහ 3124924 සම්බන්ධයෙන් එම බැඳුම්කරයන් එම බැඳුම්කර මත හා විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා දමේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 4669, 4905, 4292, 1583, 1584, 3688, 5469, 1587, 1588, 4017, 1585, 1586, 4294, 4760, 4293 සහ 4761 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර "ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

(අ) අංක 2944030 දරන ප්‍රතිව්‍යුහගත ණය සම්බන්ධයෙන්, 2025 ජූලි මස 22 දින දක්වා ඇමරිකානු ඩොලර් 1,089,923.50ක මුළු මුදලක් (ප්‍රාග්ධනය සහ පොළිය 2025 ජූලි මස 22 දින දක්වා) සහ ඉතිරි ප්‍රාග්ධන මුදල වන ඇමරිකානු ඩොලර් 871,704.83 සඳහා SOFR+8.00% (2025 ජූලි මස 22 වැනි දිනට වාර්ෂිකව 12.3222%) අනුපාතයකින් 2025 ජූලි මස 23 දින සිට ඉහත පහසුකම සම්පූර්ණයෙන් සහ අවසානව පියවන තෙක් වාර්ෂිකව තවදුරටත් පොළියක් සහිතව; සහ

(ආ) අංක 3124924 ප්‍රතිව්‍යුහගත කරන ලද ණය සම්බන්ධයෙන්, 2025 ජූලි මස 22 දින දක්වා ඇමරිකානු ඩොලර් 613,944.62ක මුලු මුදලක් (ප්‍රාග්ධනය සහ පොළිය 2025 ජූලි 22 වැනි දින දක්වා) සහ ඉතිරි ප්‍රාග්ධන මුදල වන ඇමරිකාඩු ඩොලර් 489,500.00 සඳහා SOFR+8.00% (2025 ජූලි මස 22 දිනට වාර්ෂිකව 12.3222%) අනුපාතයකින් 2025 ජූලි මස 23 දින සිට ඉහත පහසුකම සම්පූර්ණයෙන් සහ අවසානව පියවන තෙක් වාර්ෂිකව තවදුරටත් පොළියක් අය කෙරේ.

### පළමු උපලේඛනය

(1) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත කඳුකර පහළ කෝරළේ, උඩපළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, නව ගුරුකැළේ ග්‍රාම නිලධාරි වසම හි දොළුම, අඹකුඹුර සහ නිල්ලඹ ගමෙහි හි පිහිටි සීතා වැලි එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මානක බී. ජී. එම්. ද සිල්වා විසින් මැන සාදන ලද 2003.03.14 දිනැති අංක 657 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ලෙස නිරූපණය කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩමට මායිම් : උතුරට : එකී පිඹුරු අංක 3993 හි ලොට් 1බී; ඊසානට : දොළුව සිට ගුරුකැලේ යන මාර්ගය; ගිණිකොනට සහ දකුණට : දොළුව සිට ගුරුකැලේ යන මාර්ගය; බස්නාහිරට : එකී පිඹුරු අංක 3993 හි ලොට් 1බී යන මෙකී මායිම් තුළ පිහිටි අංක 657 දරන පිඹුර ප්‍රකාරව අක්කර තුනයි පර්චස් අටයි දශම හතයි අටක් (අ.03, පර්. 8.78) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනිකුත් සියලුදේත් සමග වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 09/109 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(2) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත කඳුකර පහළ කෝරළේ, උඩපළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, නව ගුරුකැළේ ග්‍රාම නිලධාරි වසම හි දොළුම, අඹකුඹුර සහ නිල්ලඹ ගමෙහි හි පිහිටි සීතා වැලි එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මානක බී. ජී. එම්. ද සිල්වා විසින් මැන සාදන ලද 2003.03.14 දිනැති අංක 657 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 ලෙස නිරූපණය කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩමට මායිම් : වයඹ සහ උතුරට : දොළුව සිට ගුරුකැලේ යන මාර්ගය; නැගෙනහිරට : එකී පිඹුරු අංක 3993 හි ලොට් 2බී; දකුණට : ගුරුකැලේ එස්ටේට් හි කොටසක් සහ බස්නාහිරට : දොළුව සිට ගුරුකැලේ යන මාර්ගය යන මෙකී මායිම් තුළ පිහිටි අංක 657 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් හයයි දශම අටයි හතරක් (අ.01, පර්. 6.84) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනිකුත් සියලුදේත් සමග වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 09/110 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපළාත කෝරළේ, හපුතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, දියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මැදිකිඳ කොට්ඨාසයේ, කඳුරුගමුව ග්‍රාම නිලධාරි වසම හි කඳුරුගමුව ගමෙහි හි පිහිටි කපුවත්ත නැමැති ඉඩමට බණ්ඩාරවෙල බලයලත් මානක විජිත සෙල්ලහේවා විසින් මැන සාදන ලද 2004.07.07 දිනැති අංක 854 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ලෙස නිරූපණය කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩමට මායිම් : උතුරට : එකී ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස; දකුණට : රජයේ ඉඩම සහ බස්නාහිරට : රජයේ ඉඩම සහ එකී ඉඩමේ ඉතිරි කොටස යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකක් (අ.02) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි අනිකුත් සෑම සියලුදේත් සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 153/10 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

**තුන්වන උපලේඛනය**

(1) මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ කොට්ඨාසයේ, ගම්පහසියපත්තු, මාතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දොරකුඹුර ග්‍රාම නිලධාරි වසම හි දොරකුඹුර ගමෙහි හි පිහිටි වරාගොල්ල වත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඩී. දසනායක විසින් මැන සාදන ලද 2004.07.12 වැනි දිනැති අංක 8268 දරන පිඹුරේ නිරූපිත ලොට් සී ලෙස නිරූපණය සහ බෙදා වෙන්කරන ලද ඉඩමට මායිම්: උතුරට : එකී පිඹුරේ ලොට් බී ලොට් ඒ දරන අඩි 10ක් පළල ප්‍රවේශ මාර්ගය; නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් ඩී; දකුණට : මුත්තයියාගේ වත්තට හිමිකම්පාන ඉඩම; බස්නාහිරට : එකී අංක 8268 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම තුනයි බිංදුවක් (පර්. 20.30) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනිකුත් සියලුදේත් සමග එකී අංක 8268 දරන පිඹුරේ ලොට් ඒ ලෙස නිරූපිත මාර්ගය භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 563/42 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(2) මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ කොට්ඨාසයේ, ගම්පහසියපත්තු, මාතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දොරකුඹුර ග්‍රාම නිලධාරි වසම හි දොරකුඹුර ගමෙහි හි පිහිටි වරාගොල්ල වත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඩී. දසනායක විසින් මැන සාදන ලද 2004.07.12 වැනි දිනැති අංක 8268 දරන පිඹුරේ නිරූපිත ලොට් ඩී ලෙස නිරූපණය සහ බෙදා වෙන්කරන ලද ඉඩමට මායිම්: උතුරට : ප්‍රධාන පාරේ සිට ඉඹුලන්දණ්ඩ යන ප්‍රාදේශීය සභා පාර; නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් ඊ; දකුණට: මුත්තයියාගේ වත්තට හිමිකම්පාන ඉඩම; බස්නාහිරට : එකී අංක 8268 දරන පිඹුරේ නිරූපිත ලොට් බී සහ සී යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දාහතයි දශම අටයි බිංදුවක් (රූ.01, පර්. 17.80) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනිකුත් සියලුදේත් සමග එකී අංක 8268 දරන පිඹුරේ ලොට් ඒ ලෙස නිරූපිත මාර්ගය භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 563/43 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

**හතරවන උපලේඛනය**

ශ්‍රී ලංකා ජනරජයේ, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත කඳුකර පහළ කෝරලයේ, නිල්ලඹ ගම්මානයේ, සීතා වැලි වතුයායේ කර්මාන්තශාලා පරිශ්‍රයට සහ/හෝ ණය ගැණුම්කරු දැන් හෝ ඕනෑම වේලාවක සහ මින් ඉදිරියට තම ව්‍යාපාරය කරගෙන යන වෙනත් ස්ථානයක හෝ පරිශ්‍රයකට ගෙන එන ලද හෝ ගෙන ආ යුතු හෝ තබා ගත හැකි වෙනත් ඕනෑම වංචල උපකරණ ඇතුළුව ක්‍රියාත්මක වන කම්හල සහ යන්ත්‍රෝපකරණ, ණය ගැණුම්කරුගේ ඕනෑම දෙයක්, කම්හල සහ යන්ත්‍රෝපකරණ/වංචල උපකරණ (පහත ලැයිස්තුගත කර ඇත) ඇතුළුව ණය ගැණුම්කරුගේ ඕනෑම දෙයක් ස්ථාපනය කළ හැකි/තබා ගත හැකි ඕනෑම දෙයක්.

**යන්ත්‍රෝපකරණ**

| අංක | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ටැබ්ලට් යන්ත්‍රය | 1 |
| 02 | ස්රික් යන්ත්‍ර | 2 |
| 03 | දූවිලි එකතු කරන යන්ත්‍රය | 1 |
| 04 | කම්පන පෙරන | 4 |
| 05 | සුපර් ස්ක්‍රම් බොයිලේරුව - 2,000 kg | 1 |
| 06 | පැනල් පුවරුවක් සහිත කැබිනට් වියළන යන්ත්‍ර | 1 |
| 07 | කුරුඳු කුඩු කරන යන්ත්‍ර | 2 |
| 08 | බ්ලෝවර් | 1 |
| 09 | DHF ආර්ද්‍රතා ලිප | 3 |
| 10 | පැනල් පුවරුවක් සහිත විෂබීජහරණය "Stafi" | 1 |
| 11 | ලෝහ හඳුනාගැනීමේ යන්ත්‍ර | 2 |
| 12 | ස්ට්‍රැපින් යන්ත්‍රය | 1 |
| 13 | මිශ්‍ර කිරීමේ යන්ත්‍රය | 1 |
| 14 | හැමර් මිල් ඒකකය | 1 |
| 15 | බකට් වාහකය | 1 |
| 16 | ඩිස්ක් මිල් | 1 |
| 17 | ඕසෝන් ඒකකය | 1 |
| 18 | පැනල් පුවරුවක් සහිත කැබිනට් වියළන යන්ත්‍ර | 1 |
| 19 | සම්පීඩකය සහිත රික්තක යන්ත්‍රය | 2 |
| 20 | DHF ආර්ද්‍රතා ලිප | 1 |
| 21 | රෝලර් C.C.C. | 3 |
| 22 | සිරොකෝ වියළන යන්ත්‍රය - අඩි 4 | 2 |
| 23 | උඳුන | 1 |
| 24 | මෝටර් සහිත මිච් සිෆ්ටර් | 2 |
| 25 | මෝටර් සහිත මිඩ්ල්ටන් සිෆ්ටර් | 1 |
| 26 | චෝටා සිෆ්ටර් | 2 |
| 27 | වාහක යන්ත්‍රය සහිත තේ කටර් | 1 |
| 28 | පල්වර් රිස් | 1 |
| 29 | වාහකය සහිත වින්නෝවර් | 1 |
| 30 | ෆිබර් එක්ස්ට්‍රැක්ටර් | 1 |
| 31 | මෝටරය සහිත ටැරී නිපර් බ්‍රේකර් | 1 |

| අංක | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 32 | රේඩියේටර් සහිත බ්ලොවර් යන්ත්‍රය | 1 |
| 33 | "මයිසා" තේ බෑග් යන්ත්‍රය | 4 |
| 34 | මිශ්‍ර කිරීමේ යන්ත්‍රය | 1 |
| 35 | බොයිලේරය | 1 |
| 36 | සෝපානය සහිත බ්ලීන්ඩින් යන්ත්‍රය | 1 |
| 37 | භූමියට යටින් පිහිටි වාහකය | 1 |
| 38 | කුටි සහිත අගල - 31 x 6 | 1 |
| 39 | කුටි සහිත අගල - 37 x 6 | 1 |
| 40 | කුටි සහිත අගල - 38 x 6 | 1 |
| 41 | කුටි සහිත අගල - 48 x 6 | 2 |
| 42 | ලෝහ අනාවරකය | 1 |
| 43 | තේ කටර් (ජපන්) | 1 |
| 44 | ජෙනරේටර් | 2 |

**පස්වන උපලේඛනය**

ශ්‍රී ලංකා ජනරජයේ, ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කය තුළ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපළාත කෝරළයේ, කඳුරුගම ගම්මානයේ පිහිටි කර්මාන්තශාලා පරිශ්‍රයට සහ/හෝ ණය ගැණුම්කරු දැන් හෝ ඕනෑම වේලාවක සහ මින් ඉදිරියට තම ව්‍යාපාරය කරගෙන යන වෙනත් ස්ථානයක හෝ පරිශ්‍රයකට ගෙන එන ලද හෝ ගෙන ආ යුතු හෝ තබා ගත හැකි වෙනත් ඕනෑම චංචල උපකරණ ඇතුළුව ක්‍රියාත්මක වන කම්හල සහ යන්ත්‍රෝපකරණ, ණය ගැණුම්කරුගේ ඕනෑම දෙයක්, කම්හල සහ යන්ත්‍රෝපකරණ/ චංචල උපකරණ (පහත ලැයිස්තුගත කර ඇත.) ඇතුළුව ණය ගැණුම්කරුගේ ඕනෑම දෙයක් ස්ථාපනය කළ හැකි/තබා ගත හැකි ඕනෑම දෙයක්.

**යන්ත්‍රෝපකරණ**

| අංක | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 22 | රෝලර් වෝකර් - 35" | 1 |
| 22 | රෝලර් වෝකර් - 40" | 1 |
| 22 | රෝලර් වෝකර් - 45" | 1 |
| 22 | රෝල් බ්‍රේකර් | 2 |
| 22 | රෝටරි රෝල් බ්‍රේකර් | 2 |
| 27 | වෝටා සිෆ්ටර් | 1 |
| 25 | මෝටර් සහිත මිච් සිෆ්ටර් | 1 |
| 26 | මෝටර් සහිත මිඩ්ල්ටන් සිෆ්ටර් | 1 |
| 37 | බ්ලැන්ඩින් යන්ත්‍රය | 1 |
| 29 | පල්වර් රීස් | 1 |
| 01 | රෝටා වේන් 8" - දේශීය 1.5 එච්. පී. මෝටරය | 2 |

| අංක | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 36 | බොයිලර් | 1 |
| 30 | වාහකය සහිත වින්නෝවර් | 1 |
| 24 | De ස්ටෝනික් යන්ත්‍රය | 2 |
| 23 | සිරොකෝ ඩ්‍රයර් - අඩි 4 | 1 |
| 23 | සිරොකෝ ඩ්‍රයර් - අඩි 3 | 1 |
| 39 | කුටි සහිත අගල - 80 x 6 | 3 |
| 40 | කුටි සහිත අගල - 88 x 6 | 1 |
| 41 | කුටි සහිත අගල - 82 x 6 | 1 |
| 42 | කුටි සහිත අගල - 84 x 6 | 1 |
| 32 | මෝටරය සහිත ටැරී නිපර් බ්‍රේකර් | 1 |
| 33 | ස්ටෝන් එක්ස්ට්‍රැක්ටර් 3 T | 1 |
| 43 | මෙටල් ඩිටෙක්ටර් | 1 |
| 37 | ලීෆ් එලිවේටර් | 1 |
| 46 | ජෙනරේටර් | 1 |

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2025 අගෝස්තු මස 29.

10 - 363

---

**අමානා බැන්ක් පීඑල්සී (PB3618PQ) - පුත්තලම ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කරන ලද ලියාපදිංචි අංක PB3618PQ යටතේ ලියාපදිංචි වී ඇති පොදු බැංකු සමාගමකි)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය.

අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.18 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරනු ලැබූ බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය යටතේ මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03, යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තා වූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන ලියාපදිංචි කිරීමේ අංක PB3618PQ දරන

අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙනුවෙන් පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. එම්. බී. අමීන් විසින් සහතික කරන ලද 2019.12.26 දින අංක 15331 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරයට අදාළව අංක 15315 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරයට අදාළව අංක 15321 දරන ප්‍රාථමක උකස් බැඳුම්කරයට අදාළව, අංක 15323 දරන ද්විතීය උකස් බැඳුම්කරයට අදාළව අංක 15325 දරන තෘතීය උකස් බැඳුම්කරයට අදාළව, අංක 15327 දරන සිව්වන උකස් බැඳුම්කරයට අදාළව සහ අංක 15329 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරයට අදාළව ප්‍රදානය කරන ලද පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම "බන්ධනදායී" යනුවෙන් හඳුන්වනු ලබන "මෙල්වුඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද; ඉහත කී උකස් බැඳුම්කර මත 2024 දෙසැම්බර් මස 31 දිනය වන විට දැනට අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙත රුපියල් මිලියන දෙසිය දොළහයි හයලක්ෂ හැට එක් දහස් එකසිය විසි නවයක් වූ (රු. 212,661,129.00) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද; අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රචාරක පිරිවැය දරන ලද වෙනත් යම් පිරිවැය සහ ගාස්තු ද සමග රුපියල් මිලියන තිහක් පමණක් වූ (රු. 30,000,000.00) මුදලක් මත 2025 ජනවාරි මස 1 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 24.5%ක් වූ අනුපාතිකය යටතේ අයෝජනය/ලාභය/වාරික මත වූ ප්‍රතිලාභය ද සමග රුපියල් මිලියන පනස් හතයි දෙලක්ෂ දාහත්දහස් පන්සිය අනූවක් පමණක් වූ (රු. 57,217,590.00) මුදලක් ද, රුපියල් මිලියන හයයි හාරලක්ෂ අසූඅටදහස් පනස් දෙකක් පමණක් වූ (රු. 6,488,052.00) මුදලක් මත 2025 ජනවාරි මස 1 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 12.46% ක් වූ අනුපාතිකය යටතේ ආයෝජනය/ලාභය/වාරික මත වූ ප්‍රතිලාභය ද සමග රුපියල් මිලියන හතයි හාරලක්ෂ හැටඑක්දහස් පන්සිය තිස්හතක් වූ (රු. 7,461,537.00) මුදලක් ද, රුපියල් මිලියන එකසිය පහයි හය ලක්ෂ හැටනවදහස් හත්සිය හැත්තෑ අටක් වූ (රු. 105,669,778.00) මුදලක් මත 2025 ජනවාරි මස 1 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 12.46% ක් වූ අනුපාතිකය යටතේ (අයෝජනය/ලාභය/වාරික මත වූ ප්‍රතිලාභය ද සමග රුපියල් මිලියන එකසිය හතළිස් තුනයි හයලක්ෂ නවදහසක් (රු. 143,609,000.00) පමණක් වූ මුදලක් ද, රුපියල් මිලියන හතරයි තුන්ලක්ෂ හැත්තෑතුන්දහස් දෙකක් පමණක් වූ (රු. 4,373,002.00) මුදලක් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 15331, 15315, 15323, 15325, 15327 සහ 15329 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙත උකස් කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ, අංක 30/83, කටුවාවල පාර, මහරගම යන ලිපිනයේ පදිංචි බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක සහ සේනානායක යන මහත්වරුන් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල යටතේ අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

**1 වන දේපළ**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පුත්තලම පත්තුව කොට්ඨාසයේ, උතුරු පුත්තලම පත්තුවේ, 606 - මනල්තීව් ග්‍රාමනිලධාරී කොට්ඨාසය ඇතුළත මනල්තීවු ග්‍රමායේ පිහිටා ඇත්තා වූ ද "වෙන්කානි" යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දහ අටක් වූ ද (අ. 18) උතුරට : පේරුවෙලි ද; නැගෙනහිරට: මන්නාරම් පාර ද; දකුණට : ලුණු ලේවාය වෙත දිවෙන පාර ද සහ බටහිරට : පලන්තිවූ වෙත දිවෙන වටින් ඇළ මාර්ගය ද යන සමස්ථ මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

ඉහත කී ඉඩම පුත්තලම බලයලත් මිනින්දෝරු පොන්, තංගවඩිවේලු විසින් මැන සාදන ලද 1998.06.24 දින අංක 213 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දහඅටයි පර්චස් තිස් එකක් වූ ද (අ.18, පර්. 31);

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලියෝන් යන අයගේ ඉඩම සහ මාර්ගය ද; |
| *නැගෙනහිරට* | : | නසීර් යන අයගේ ඉඩම ද; |
| *දකුණට* | : | මාර්ගය ද; |
| *බටහිරට* | : | පාර ද; |

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

වඩාත් මෑතකාලීන මැනීමක් මගින් ඉහත කී ඉඩම පුත්තලම බලයලත් මිනින්දෝරු වී. වික්නේස්වරන් විසින් මැන සාදන ලද 2008.10.16 දින අංක 3674 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ලෙස ලකුණු කර ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර දහඅටයි පර්චස් තිස් එකක් වූ ද (අ.18, පර්. 31) උතුරට : ලියෝන් යන අයගේ ඉඩම සහ ප්‍රාදේශීය සභා පාර ද (ගෙවතුවල සිට මානතිවු දෙසට); නැගෙනහිරට : නසීර් යන අයගේ ඉඩම ද; දකුණට : ප්‍රාදේශීය සභා පාර ද (ගෙවතුවල සිට ප්‍රධාන මාර්ගය දෙසට) සහ බටහිරට: පාර ද (ප්‍රාදේශීය සභා පාර) යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A45/114 යන හිමිකම් බෙදීම/වෙලුම/ පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ලොට් අංක 1 සහ 2 ලෙස නිරූපණය කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

**2 වන දේපළ**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පුත්තලම පත්තුව කොට්ඨාසයේ, උතුරු පුත්තලම පත්තුවේ, 606 - මනල්තීව් ග්‍රාමනිලධාරී කොට්ඨාසය ඇතුළත මනල්තිවු ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "පල්ලිවාසල් මරිකාර් තෝට්ටම්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා පුත්තලම බලයලත් මිනින්දෝරු එන්. සකරලිංගම් විසින්

මැන සාදන ලද 2000.11.01 දින අංක 4410 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම නවයයි දෙකක් වූ ද (පර්. 13.92) උතුරට: වී. ජී. සාලිහු යන අයගේ ඉඩම ද; නැගෙනහිරට : මන්නාරම මාර්ගය ද; දකුණට : රත්නා උම්මා යන අයගේ ඉඩම ද; බටහිරට: අයිශා නස්රා යන අයගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A169/69, MOV 44/17 දරන හිමිකම/බෙදීම/වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

**3 වන දේපළ**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කහවත්ත, 557 - කහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කහවත්ත ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද "පිටකොටුවත්ත, පන්නිකාච්චලේවත්ත සහ ගලපිටගෙදරවත්ත" යනුවෙන් හඳුන්වන ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් මැන සාදන ලද 1999.06.20 දින අංක 1305 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද; ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම එකක් (රූ.1, පර්. 12.1) *හෙවත්* හෙක්ටයාර් 0.1318 ක් වූ ද; උතුරට : එම ඉඩම ද; නැගෙනහිරට : එම ඉඩම ද; දකුණට : මාර්ග ප්‍රවේශය ද (බුලුගහතැන්න සිට මහනුවර මාතලේ ප්‍රධාන මාර්ගය) සහ බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ U114/55, MOV 155/120 දරන හිමිකම් කොටසේ/වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

**4 වන දේපළ**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, පල්ලේගම්පහ තුළ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාවේ, කහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත බුලුගහතැන්න ග්‍රාමයේ දැන් කහවත්ත යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද "අස්වැද්දුව කුඹුර" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ටී.බී. අත්තනායක විසින් මැන සාදන ලද 2000.10.03 දින අංක 7932 දරන පිඹුරේ ලොට් අංක 2 සහ 3 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සයි දශම දෙකයි පහක් වූ ද (රූ. 2, පර්. 20.25) උතුරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 04 (ඔයට ප්‍රවේශය) ද; ඊසානදිගට : බුලුගහතැන්න සිට නිවාස වෙත දිවෙන ගම්සභා පාර ද; ගිනිකොණදිගට : හබීබ් මොහොමඩ් සහ තවත් අයගේ උඩවෙලගෙදර වත්ත ඉඩම වෙන් කරන අගල ද; බටහිරට : ගුරුනෑහෙල කුඹුර සහ පිංගාඔය වෙන් කරනු ලබන අගල ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ U79/94, MOV 155/106 දරන හිමිකම් කොටස/වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ඉහත කී ලොට් අංක 2 සහ 3 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ සහ එකී පිඹුරේ ලොට් අංක 04 ලෙස නිරූපිත පාර ඔස්සේ සහ ඒ මතින් යෑම් ඒමේ මාර්ග පරවශතා අයිතිය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මතය ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයට අත්සන් කිරීම සඳහා අමානා බෑන්ක් පීඑල්සී ආයතනයේ අයකිරීම් කළමනාකරණ ප්‍රධානී රීසා ඉස්මායිල් මහතාට බලය පැවරීමට ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රීසා ඉස්මායිල්,
අයකිරීම් කළමනාකරණ - ප්‍රධානී.

10 - 324

---

**මහජන බැංකුව - කඩුවෙල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

අරඹේගෙදර චම්පිකා සංජීවනී ස්වර්ණතිලකා කුමාරි

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.09 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ලොකුගේ මනූජා නාරංගොඩ මහත්මිය විසින් 2020.11.27 දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 7369 සහ කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ලොකුගේ මනූජා නාරංගොඩ මහත්මිය විසින් 2022.10.20 දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 8155 දරන උකස්කර ප්‍රකාර ගෙවීම,

අරඹේගෙදර චම්පිකා සංජීවනී ස්වර්ණතිලකා කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කර මත 2025.06.15 දිනට රුපියල් එක් කෝටි හැත්තෑනව ලක්ෂ පනස් එක් දහස් හතළිස් නවයයි ශත විස්සක (රු. 17,951,049.20) මුළු මුදලක් හා රුපියල් පනස් හතර ලක්ෂ විසි දෙදහස් දෙසිය දහහතයි ශත හැටක (රු. 5,422,217.60) මුලු මුදලක් හා රුපියල් එක් කෝටි විසිතුන් ලක්ෂ පනස් දෙදහස් නවසිය හැත්තෑ නවයයි

ශත නවයක (රු. 12,352,979.09) මුලු මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, එකී මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් 2025.06.16 දින සිට රුපියල් මිලියන පහළොවක (රු. 15,000,000.00) මුදලට 14.75% බැගින් සහ 2025.06.16 දින සිට රුපියල් හතළිස් හතර ලක්ෂ අසූනව දහස් නවසිය අසූඅටක (රු. 4,489,988.00) මුදලට 32.0% බැගින් සහ 2025.06.16 දින සිට රුපියල් අනූනව ලක්ෂ අනූනව දහස් නවසිය අසූඅටක (රු. 9,999,988.00) මුදලට 20.0% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය, විකිණීමේ ගාස්තු සහ අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක් කෝටි හැත්තෑ නව ලක්ෂ පනස් එක් දහස් හතළිස් නවයයි ශත විස්සක (රු. 17,951,049.20) මුදල හා රුපියල් පනස් හතර ලක්ෂ විසි දෙදහස් දෙසිය දහහතයි ශත හැටක (රු. 5,422,217.60) මුදල හා රුපියල් එක් කෝටි විසිතුන් ලක්ෂ පනස් දෙදහස් නවසිය හැත්තෑ නවයයි ශත නවයක (රු. 12,352,979.09) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ප්‍රේමසිරි වඩුගේ විසින් එකී අංක 7369 සහ 8155 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 496 බී කොට්ටාව ග්‍රාම නිලධාරි වසමේ, කොට්ටාව යන ගම පිහිටි, "ගොඩපොරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද මහතා විසින් 2020.07.22 වැනි දින මැන සාදන ලද අංක 8743 දරන පිඹුරෙහි ලොට් අංක X දරන කොටසට මායිම් :

*උතුරට* : පොදු පාර මීටර් 5.00 - 5.50 (අංක 7524 දරන පිඹුරේ ලොට් අංක C1) සහ අංක 2367 දරන පිඹුරේ ලොට් අංක 3 ද;

*නැගෙනහිරට* : අංක 2367 දරන පිඹුරේ ලොට් අංක 3 දරන කැබැල්ල සහ මෙම පිඹුරේ ලොට් Y ද;

*දකුණට* : මෙම පිඹුරේ ලොට් Y සහ අංක 2367 දරන පිඹුරේ ලොට් අංක 2 දරන කැබැල්ල ද;

*බස්නාහිරට* : අංක 2367 දරන පිඹුරේ ලොට් අංක 2 දරන කැබැල්ල, අංක 7524 දරන පිඹුරේ ලොට් අංක C3 සහ පොදු පාර මීටර් 5.00 - 5.50 (අංක 7524 දරන පිඹුරේ ලොට් අංක C1) ද;

යන මෙකී මායිම් තුළ වූ පර්චස් එකොළහයි දශම බිංදුවයි දෙකක් (පර්. 11.02) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

මිනින්දෝරු එච්. කේ. මහින්ද මහතා විසින් 2018.06.17 වැනි දින මැන සාදන ලද අංක 7254 දරන පිඹුරෙහි ලොට් අංක C1 සහ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2017.10.31 වැනි දින මැන සාදන ලද අංක 7382 දරන පිඹුරෙහි ලොට් අංක B සහ අංක 8743 දරන පිඹුරෙහි මාර්ග වෙනුවෙන් වෙන්කර ඇති සියලුම මාර්ගවල පොදු මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

මෙම ඉඩම කොට්ටාව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ C 378/115 හි ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
කොළඹ නැගෙනහිර.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ නැගෙනහිර, මහජන බැංකුව,
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

10 - 286

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩී. සී. සැන්ඩසන්
ගිණුම් අංක : 1046 5771 1147/1046 5755 4051/ 6046 6000 1272

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. එම්. ඩී. කිත්සිරි යන අය විසින් ලියා සහතික කරන ලද 2018 සැප්තැම්බර් මස 11 දාතම හා අංක 3208 දරන සහ බදුල්ල ප්‍රසිද්ධ

නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි මස 24 දාතම හා අංක 2825 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඩියනා කැතරින් සැනඩසන් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3208 සහ 2825 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිඑක් කෝටි අසූ හතර ලක්ෂ හැත්තෑ හත් දහස් පන්සිය පහයි ශත අනූ හයක (රු. 218,477,505.96) මුදලක් 2025 සැප්තැම්බර් මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිඑක් කෝටි අසූ හතර ලක්ෂ හැත්තෑ හත් දහස් පන්සිය පහයි ශත අනූ හයක (රු. 218,477,505.96) මුදල ද, 2025 සැප්තැම්බර් මස 04 දින සිට අංක 3208 සහ 2825 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ අට ලක්ෂ නව දහස් දහ හතයි ශත අනූ එකක (රු. 8,809,017.91) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) හා තවත් රුපියල් අට කෝටි හැට අට ලක්ෂ අනූ දහස් හාරසිය හැට හතරයි ශත අටක (රු. 86,890,464.08) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහයි බිංදුවක් (14.50%) හා තවත් රුපියල් අසූහය ලක්ෂ තිස් එක් දහස් දෙසිය හැට නවයයි ශත තිස් එකක් (රු. 8,631,269.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහයි දශම අටක් (5.8%) හා තවත් රුපියල් තුන් කෝටි අසූ හත් ලක්ෂ හැට හය දහස් අටසිය හැත්තෑවයි ශත අනූ තුනක (රු. 38,766,870.93) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහයි දශම අටක් (5.8%) හා තවත් රුපියල් එක් කෝටි විසි දෙලක්ෂ අනූ තුන් දහස් තුන්සිය අනූ පහයි ශත හතලිස් පහක (රු. 12,293,395.45) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lendin Rate + Three per centum (AWPLR+3%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3208 සහ 2825 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ කොට්ඨාසයේ, කන්දපැල්ල කෝරළේ, දඹවැල්ගම මහපළාත කෝරළේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ විහාරගල ග්‍රාම සේවක කොට්ඨාසය තුළ හපුතලේගම පිහිටි "විහාරගල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන විජිත සෙල්ලහේවා යන අය විසින් සාදන ලද 2018 අගෝස්තු මස 23 දාතම හා අංක 3391 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: එස්ටේට් පාර, ලොට් 01 සහ පාර (H); නැගෙනහිරට : පාර (H) සහ ලොට් 03; දකුණට : ලොට් 3 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පවරාගෙන ඇති විහාරගල එස්ටේට් හි කොටසක් සහ තුසිත විජේසේන විසින් හිමිකම් කියන එස් ඩී පෙදෙස සහ බස්නාහිරට : තුසිත විජේසේන විසින් හිමිකම් කියන එස් ඩී පෙදෙස සහ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දහ අටයි පර්චස් තිස් හයයි දශම එකයි එකක් (අක්. 18, පර්. 36.11) හෝ හෙක්ටයාර් 0. 8107 ක් විශාල ඉඩම් කොටස එහි පිහිටි සැම සියලු දේ සමග වෙළුම/ පත්‍රිරුව X35/47 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී බලයලත් මානක තැන විජිත සෙල්ලහේවා යන අය විසින් සාදන ලද 2018 අගෝස්තු මස 23 දාතම හා අංක 3391 දරන එකී පිඹුරේ නිරූපිත එස්ටේට් පාර දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද යන පොදු අයිතීන් සමග ය.

අංක 3391 දරන පිඹුරේ එකී ලොට් 02 පහතින් විස්තර කොට ඇති ඉඩමේ උපබෙදුමකි :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ කොට්ඨාසයේ, කන්දපැල්ල කෝරළේ, දඹවැල්ගම මහ පළාත කෝරළේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ විහාරගල ග්‍රාම සේවක කොට්ඨාසය තුළ, හපුතලේගම පිහිටි "විහාරගල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බදුල්ල බලයලත් මානක තැන එම්. ෆුවාඩ් ඉස්මයිල් යන අය විසින් සාදන ලද 1975 පෙබරවාරි මස 20 සහතික කරන ලද සහ 1974 නොවැම්බර් මස දාතම හා අංක 794/LRC/Ba/2/6/6 දරන මිනුම් පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 04 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ප්‍රධාන පාර; නැගෙනහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් පවරාගෙන ඇති විහාරගල එස්ටේට් හි කොටසක්; දකුණට : විහාරගල එස්ටේට් හි කොටසක් සහ තුසිත විජේසේන විසින් හිමිකම් කියන සහ බස්නාහිරට : ලොට් 01 සහ ප්‍රකාශකගේ එස් ඩී පෙදෙස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර විස්සයි රූඩ් දෙකක් (අක්. 20, රූඩ් 02) විශාල ඉඩම් කොටස එහි පිහිටි සැම සියලු දේ සමග වෙළුම/ පත්‍රිරුව X12/64 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-362

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

1. ෆොරස්ට් ට්‍රේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   ගිණුම් අංක : 0070 1000 1115/ 5070 3100 0138

2. ෆ(ර්)ස්ට් කැපිටල් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   ගිණුම් අංක : 0070 1000 0100

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එච්. සී. ලක්මිණී විසින් ලියා සහතික කරන ලද 2019 පෙබරවාරි මස 01 දාතම හා අංක 731 දරන සහ ඒ. ආර්. උදයංග විසින් ලියා සහතික කරන ලද 2022 ඔක්තෝබර් මස 27 දාතම හා අංක 3014 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 78980 දරන ශ්‍රී ලංකා සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ෆොරස්ට් ට්‍රේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා අනුක බන්දුල ඇන්තනි සෝසා උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එච්. සී. ලක්මිණී විසින් ලියා සහතික කරන ලද 2018 නොවැම්බර් 05 දාතම හා අංක 630 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 65520 දරන ශ්‍රී ලංකා සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ෆ(ර්)ස්ට් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා අනුක බන්දුල ඇන්තනි සෝසා උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද,

එකී අංක 731, 3014 සහ 630 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි හැත්තෑ ලක්ෂ විසි හතර දහස් හාරසිය හතයි ශත අනූ නවයක (රු. 87,024,407.99) මුදලක් සහ අමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ විසි පන් දහස් පන්සිය හතලිස් තුනයි ශත විසි අටක (USD 225,543.28) මුදලක් 2025 සැප්තැම්බර් 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අට කෝටි හැත්තෑ ලක්ෂ විසි හතර දහස් හාරසිය හතයි ශත අනූ නවයක (රු. 87,024,407.99) මුදල සහ අමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ විසි පන් දහස් පන්සිය හතලිස් තුනයි ශත විසි අටක (USD 225,543.28) මුදල යන මුදල් වල මුළු එකතුව 2025 සැප්තැම්බර් 15 දින සිට අංක 731, 3014 සහ 630 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, එක්සත් ජනපද ඩොලර් හැත්තෑ දහස් පන්සිය අසූවක (USD 70,580.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%), එක්සත් ජනපද ඩොලර් අනූ නම දහස් දෙසිය තිස් හතක (USD 99,237.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%), රුපියල් එක්කෝටි හැට හත් ලක්ෂ හැට එක් දහස් හාරසිය හැට අටයි ශත අනූ හතරක (රු. 16,761,468.94) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%), රුපියල් තුන්කෝටි හතලිස් හය ලක්ෂ හැත්තෑ දහස් එකසිය විස්සයි ශත හැට තුනක (රු. 34,670,120.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) හා තවත් රුපියල් එක් කෝටි දහ තුන් ලක්ෂ අසූ හය දහසක (රු. 11,386,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 731, 3014 සහ 630 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

(1) (I) දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කිරින්ද ග්‍රාම නිලධාරි වසමේ, කිරින්ද පිහිටි "කිරින්ද ගොඩන" යයි කියන ඔහුගේ භාරයේ තබාගෙන ඇති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සකසන ලද ෆීල්ඩ් ෂීට් 85 හි F.T.P. 2 දරන පිඹුරේ නිරූපිත ලොට් 3732 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : F.T.P. 2 හි ලොට් 3778; නැගෙනහිර : F.T.P. 2 හි ලොට් 3778; දකුණට : F.T.P. 2 හි ලොට් 3733; බස්නාහිරට : F.T.P. 2 හි ලොට් 3778 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0210 ක් විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග පිඹුරු අංක F.T.P. 2 ට අනුව වෙළුම/පත්ඉරුව LDO K 01/69 යටතේ හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නිසිලෙස ලියාපදිංචි කොට ඇත.

